## විවෘත ටෙන්ඩර් කැදවීම- 2024/ 2025

## මස්කෙළිය ප්‍රාදේශිය සභාව

මස්කෙළිය ප්‍රාදේශිය සභාව සතු ගව මස් කඩය /එළු මස් කඩය /මාළු කඩ සභාව සතු වැසිකිළි පද්ධතිය හා තාවකාලික කඩ කාමර හා ශ්‍රිපාද වන්දනා සමයේ නල්ලතන්නිය පොදු රථගාල හා නල්ලතන්නිය සිට සිත ගගුල දක්වා වැසිකළි පද්ධති 2024/2025 වර්ෂය සදහා බදු දිම පිණිස පහත සදහන් කොන්දේසි වලට යටත්ව ටෙන්ඩර් කැදවනු ලැබේ.

<u>කඩ කාමර බදු දිම- මස්කෙළිය</u>

| අනු අංකය | බදු දෙනු ලබන දේපළ | අවම ලංසුව රු. | ආපසු ගෙවන ටෙන්ඩර් තැන්පත් මුදල රු. | ආපසු නොගෙවන ලද ටෙන්ඩර් තැන්පත් මුදල රු |
|---|---|---|---|---|
| 01 | මස්කෙළිය ගවමස් කඩය අංක 09 | 4,840,000.00 | 200,000.00 | 15,000.00 |
| 02. | මස්කෙළිය එළුමස් කඩය අංක 08 | 336,000.00 | 50,000.00 | 7,500.00 |
| 03. | මස්කෙළිය මාලු කඩය අංක 01 | 210,000.00 | 35,000.00 | 7,500.00 |
| 04 | මස්කෙළිය මාලු කඩය අංක 02 | 210,000.00 | 35,000.00 | 7,500.00 |
| 05. | මස්කෙළිය මාලු කඩය අංක 03 | 210,000.00 | 35,000.00 | 7,500.00 |
| 06. | අප්කට් මාලු කඩය අංක 01 | 162,000.00 | 30000.00 | 7,500.00 |
| 07. | මස්කෙළිය පොදු වැසිකිළිය | 233,000.00 | 30,000.00 | 7.500.00 |
| 08 | අප්කට් පොදු වැසිකිළිය | 10,000.00 | 5000.00 | 1000.00 |

<u>තාවකාලික කඩ කාමර - නල්ලත්නිය මුලගම හන්දිය හා මස්කෙළිය හා ගාඩ්මෝර් හන්දිය</u>

| අනු අංකය | බදු දෙනු ලබන සේවාව | අවම ලංසු මුදල (මසකට) | ආපසු ගෙවන තැන්පත් මුදල | ආපසු නොගෙවන ලද ටෙන්ඩර් තැන්පත් මුදල රු |
|---|---|---|---|---|
| 01. | නල්ලත්නිය මුල්ගම හන්දිය තාවකාලික කඩ කාමරය අංක -09 | 5000.00 | 50,000.00 | 2000.00 |
| 02. | මස්කෙළිය නගරය හතරවන විදිය තාවකාලික කඩ කාමර අංක 02 | 5000.00 | 90,000.00 | 2000.00 |
| 03. | මස්කෙළිය නගරය හතරවන විදිය තාවකාලික කඩ කාමර අංක 03 | 5000.00 | 90,000.00 | 2000.00 |
| 04 | මස්කෙළිය නගරය හතරවන විදිය තාවකාලික කඩ කාමර අංක 04 | 5000.00 | 90,000.00 | 2000.00 |
| 05 | ගාඩ්මෝර් හන්දිය තාවකාලික කඩ- අංක 08 | 5000.00 | 90,000.00 | 2000.00 |
| 06 | අප්කට් තාවකාලික කඩය 07 | 5000.00 | 90,000.00 | 2000.00 |

<u>නල්ලතන්නිය පොදුරථගාල හා වැසිකිළි පද්ධතිය හා රථගාල</u>

| අනු අංකය | බදු දෙනු ලබන සේවාව | අවම ලංසු මුදල | ආපසු ගෙවන ලබන ටෙන්ඩර් තැන්පත් මුදල රු. | ආපසු නොගෙවන ලද ටෙන්ඩර් තැන්පත් මුදල රු |
|---|---|---|---|---|
| 01 | නල්ලතන්නිය පොදු රථගාල හා පොදු වසිකිළි පද්ධතිය | 1,980,000.00 | 200,000.00 | 10,000.00 |

<u>නල්ලතන්නිය - ශ්‍රිපාද මාර්ගය</u>

| අනු අංකය | බදු දෙනු ලබන සේවාව | අවම ලංසු මුදල | ආපසු ගෙවන ටෙන්ඩර් තැන්පත් මුදල රු. | ආපසු නොගෙවන ලද ටෙන්ඩර් තැන්පත් මුදල රු |
|---|---|---|---|---|
| 01. | මකර තොරණ පොදු වැසිළිය | 1,078,000.00 | 50,000.00 | 7500.00 |
| 02. | ගගුලතැන්න පොදු වැසිකිළිය | 715,000.00 | 50,000.00 | 7500.00 |

ටෙන්ඩර් පෝරම 2024.11.13 දින පෙ.ව. 9.00 සිට 2024.11.26 වන දින ප.ව 4.00 දක්වා රජයේ වැඩ කරන කාර්යාල දිනයන්හි නියමිත ගාස්තු ගෙවා මස්කෙළිය ප්‍රාදේශිය සභා කාර්යාලයෙන් ලබා ගත හැක.

ටෙන්ඩර් මුල් පිටපත හා අනු පිටපත වෙනම කවර බහාලිමෙන් පසුව ලියුම් කවරයෙහි වම්පස උඩ කෙළවර බදු දෙන ලද දේපලෙහි හෝ සේවාවේ නම සදහන් කරන්න.

අදාල ටෙන්ඩර්පත් " ලේකම්, මස්කෙළිය ප්‍රාදේශිය සභාව, මස්කෙළිය" යන ලිපිනයට 2024.11.27 . දින පෙ.ව.10.00 ට පෙර ලැබෙන අයුරින් ලියාපදිංචි තැපැලෙන් හෝ කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලිමෙන් ටෙන්ඩර් ඉදිරිපත් කළ හැකි වේ. එදිනම පෙ.ව.10.30ට ටෙන්ඩර් විවෘත කරනු ලබන අතර ඒ සඳහා ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයෙකුට ටෙන්ඩර් මණ්ඩළය ඉදිරියේ පෙනි සිටිය හැක.

නියමිත වේලාවෙන් පසුව ඉදිරිපත් කරන ටෙන්ඩර් ප්‍රතික්ශේප කරනු ලැබේ. ටෙන්ඩර් පිළිගත් බව දැනුම් දුන් වහාම ටෙන්ඩර්කරු සභාව සමග ගිවිසුමකට එළඹිය යුතුය.

එක් අයදුම්කරුවෙකුට බදු දෙනු ලබන සේවාවන් කිහිපයක් සඳහා වුවද ටෙන්ඩර් ඉදිරිපත් කළ හැකි වේ.

1. බදු කාල සිමාව 2025.01.01 සිට 2025.12.31 දක්වා වලංගු වේ.

2. ගවමස් හා එළුමස් ටෙන්ඩර් ලබා ගන්නා ටෙන්ඩර්කරු විසින් මස්කෙළිය ප්‍රාදේශිය සභාව ගව ඝාතකාගාරය පමණක් භාවිතා කිරිම අනිවාර්ය වේ.

3. 2024.11.27 වන දින පෙ.ව 10.30 ට P.M.D උත්සව ශාලාවේ දි ටෙන්ඩර් විවෘත කරනු ලැබේ.

4. මස්කෙළිය හා අප්කට් නගරයේ ටෙන්ඩර් සඳහා ටෙන්ඩර් මුදලින් 40% ක් එම අවස්ථාවේ දිම ගෙවිය යුතු අතර ඉතිරි මුදල සඳහා ඇපකරයක් ලබා දිය යුතුයි.

5. නල්ලතන්නිය නගරයේ ටෙන්ඩරය සඳහා ටෙන්ඩර්කරු විසින් ඉදිපත් කරන ටෙන්ඩර් මුදලින් 50%ක මුදලක් එම අවස්ථාවේදිම ගෙවිය යුතු අතර ඉතිරි මුදල සඳහා ඇපකරයක් ලබා දිය යුතුයි.

6. තාවකාලික කඩ කාමර සඳහා වැඩිම ලංසු මුදලක් ඉල්ලුම් කරන පුද්ගලයින් සඳහා ටෙන්ඩරය පිරිනමනු ලබන අතර නල්ලතන්නිය මුල්ගම හන්දියේ කඩය සඳහා තැන්පත් කරනු ලබන මුදල් ශ්‍රී පාද වන්දනා වාරය අවසන් විමෙන් පසුව ගෙවනු ලැබේ.

7. මස්කෙළිය හා ගාඩ්මෝර් හන්දිය තාවකාලික කඩ කාමර සඳහා බදු කාල සිමාව වර්ෂ 5ක් වන අතර අදාළ තැන්පත් මුදල් බදුකාල සිමාවෙන් පසුව ගෙවනු ලැබේ.

8. ටෙන්ඩර්කරු විසින් ටෙන්ඩරය ඉල්ලා අස් කරනු ලැබුවහොත් ආපසු ගෙවන ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු නොගෙවනු ලබන අතර අදාළ ටෙන්ඩර්කරුගේ නම අසාධු ලේඛන ගත කරනු ලැබේ.

9. ටෙන්ඩර් මුදලට අමතරව 1% ක මුද්දර බදු මුදල ද ගෙවිය යුතුයි. (රජයේ ප්‍රතිපත්ති මත මෙම බදු වර්ගයන් හෝ ප්‍රතිශත වෙනස් විය හැක.)

10. නල්ලතනිය ශ්‍රිපාද වන්දනා බදුකාල සිමාව 2024.12.14 සිට 2025.05.12 දක්වා වේ.

11. නල්ලතන්නිය නගරයේ වැසිකිළි පවිත්‍ර කිරිම හා වාහන පාලනය සඳහා කම්කරුවන් යෙදවිම ටෙන්ඩර්කරු විසින් සිදු කළ යුතුයි

12. කලින් වර්ෂයේ ටෙන්ඩර් ලබා ගන්නා ලද ටෙන්ඩර්කරුවන් විසින් ඒ සඳහා හිඟ මුදල් ගෙවිමට තිබේ නම් එම හිඟ මුදල් ගෙවිමෙන් පසුව ටෙන්ඩර් පෝරම ලබා ගැනිම සඳහා ඉදිරිපත් විය හැක.

13. පිළිගත් ටෙන්ඩර්කරු විසින් ටෙන්ඩර් කොන්දේසි අනුව කටයුතු කිරිම ප්‍රතික්ශේප කරනු ලැබුවහොත් ඔවුන්ගේ ඇප මුදල් සභා සන්තක කරන අතර ටෙන්ඩර් සම්බන්ධයෙන් වරදක් කරනු ලැබු අයෙකු සේ සලකා අසාදු ලේඛණයට ඔවුන්ගේ නම් ඇතුලත් කරනු ලැබේ.

14. ටෙන්ඩර් කාල සිමාව තුළ සියළු විදුලි බිල්පත්,ජල බිල්පත් ටෙන්ඩර් ලබා ගත් අය විසින් ගෙවිය යුතුයි.

15. නල්ලතන්නිය පොදුරථගාල හා වැසිකිළි පද්ධතියේ සුදුසුකම් ලැබු ටෙන්ඩර්කරුගේ ආපසු ගෙවන තැන්පත් මුදල වන්දනා වාරය අවසන් විමෙන් පසු නැවත ගෙවනු ලැබේ.

16. වැසිකිළවල අපද්‍රව්‍ය ඉවත් කිරිමේ කටයුතු ඔබ විසින් කරවා ගත යුතුය. එය මහජන සෞඛ්‍ය පරික්ෂකගේ හා ලේකම්තුමා විසින් බලය පවරනු ලබන මස්කෙළිය ප්‍රාදේශිය සභා නිලධාරියෙකුගේ අධික්ෂණය යටතේ සිදු විය යුතුය.

17. ටෙන්ඩර් විවෘත කරනු ලබන අවස්ථාවේ දි අදාළ කටයුතු සඳහා ගිවිසුම් අත්සන් කිරිම සඳහා වු මුද්දර ගාස්තු සහ නිතිඥ ගාස්තු ද ඔබ විසින් දැරිය යුතුයි.

18. ටෙන්ඩර්කරු විසින් තම අනන්‍යතාවය තහවුරු කිරිම සඳහා ජාතික හැදුනුම්පත ඉදිරිපත් කළ යුතු අතර ග්‍රාම නිලධාරිතුමා විසින් නිකුත් කරනු ලබන ග්‍රාම නිලධාරි සහතිකය ද ඉදිරිපත් කිරිම අත්‍යාවශ්‍ය වේ.( ටෙන්ඩර් අයදුම්පත සමග)

19. ටෙන්ඩර් මණ්ඩළයේ තිරණය අවසන් තිරණය වේ.

ලේකම් , 2024.11.12

මස්කෙළිය ප්‍රාදේශිය සභාව,

මස්කෙළිය